**ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය - 2016**

-------------------------------------------------------------------------------

ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 අහිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේනම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 අහිතකර මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට ලංකා පිහන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම

2015 සහ 2016 වර්ෂ අවසානයට මණ්ඩලයේ පිළිවෙලින් රු.535,643,537 ක හා රු.525,639,091 ක ඍණාත්මක ශුද්ධ වත්කම් තත්ත්වයක් පැවතුණු අතර එම වර්ෂවල මණ්ඩලයේ මුළු වත්කම් වලට මුළු වගකීම් අනුපාතය පිළිවෙලින් 1:5.60 ක් හා 1:5.04 ක් වූයෙන් කාරක ප්‍රාග්ධන ගැටළු ඇතිවී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය වන විට මණ්ඩලයේ ස්ථිර කාර්ය මණ්ඩලය 39 දෙනෙකුට සීමාවී තිබූ අතර මණ්ඩලය සතු කම්හල් 09 න් කම්හල් 04 ක් පසුගිය යුධ වාතාවරණය සහ අමුද්‍රව්‍ය හිඟකම හේතුවෙන් වසා දමා තිබුණි. මණ්ඩලයේ කම්හල් සුදුසු ආයෝජකයන්ට බදු දීම හා ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා 2010 වර්ෂයේ සිට ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය ඉවත් කර නිසි බලධාරීවරයෙකු පත්කර තිබූ අතර මණ්ඩලය දිගින් දිගටම පවත්වාගෙන යාම කෙරෙහි මෙම කරුණු අහිතකර ලෙස බලපා තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි ඡේද අංක 55 ප්‍රකාරව වත්කමක ක්ෂය කිරීම එය පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්ත්වයට ගෙන ආ පසු ආරම්භ කළ යුතුය. එහෙත් එයට පටහැනිව ආයතනය විසින් වත්කමක් මිලදීගත් වර්ෂයේදී ක්ෂය නොකිරීමටත් වත්කම අපහරණය කරන වර්ෂයේදී ක්ෂය කිරීමත් සිදුකරන බව ගිණුම්කරණ ප්‍රතිපත්ති 2 යටතේ හෙළිදරව් කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගත් එකතුව රු.678,820 ක වත්කම් ක්ෂය කර නොතිබුණි.

#### 2.2.3 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

**(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 02**

(i) ප්‍රමිතයේ 36(ඒ) ඡේදය ප්‍රකාරව තොග අගය කිරීමේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 36(ඊ) ඡේදය ප්‍රකාරව තොග කපා හැරීම සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවත්, 2016 දෙසැම්බර් 31 දිනට එකතුව රු.1,750,649 ක් වූ කම්හල් 02 ක තොග කපා හැරීම සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16**

-------------------------------------

ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.4,378,333 ක් වූ වාහන 03 ක් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇතත්, තව දුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.4 ගිණුම්කරණ අඩුපාඩු**

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කම්හල් 02 ක නිෂ්පාදන කාර්යයන් සඳහා 2011 සහ 2012 වර්ෂ වලදී රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු එකතුව රු.1,000,000 ක් අදාළ වර්ෂයන්හි ආදායම් ලෙස ආදායම් ප්‍රකාශයට බැර කිරීම වෙනුවට අමාත්‍යාංශ සංචිත ගිණුමට බැර කිරීම නිසා එම වටිනාකමින් අමාත්‍යාංශ සංචිත නමින් ව්‍යාජ සංචිතයක් ඇති වී තිබුණි.

(ආ) මණ්ඩලයේ සේවකයින්ගේ ස්වේච්ඡා විශ්‍රාම වන්දි, පාරිතෝෂික මුදල් සහ හිඟ අර්ථ සාධක අරමුදල් ගෙවීම රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව විසින් සිදු කර තිබුණි. ඒ සඳහා 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අවස්ථා 02 කදී එම සංස්ථාව මණ්ඩලය වෙනුවෙන් ගෙවන ලද එකතුව රු.387,275,583 ක මුදල රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාවට ගෙවිය යුතු ලෙස දැක්වීම වෙනුවට දිගුකාලීන බැරකම් යටතේ භාණ්ඩාගාර ණය ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සංස්ථාවේ ආයතන හා පරිපාලන වියදම් යටතේ ඇතුළත් කළ යුතු එකතුව රු.26,067,612 ක් සහ ඉහළ කළමනාකාරීත්ව දීමනා ලෙස ගෙවන ලද එකතුව රු.1,222,500 ක පරිපාලන වියදම් මූල්‍ය ප්‍රකාශනවල නිෂ්පාදන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඈ) නිෂ්පාදන පිරිවැයට ඇතුළත් විය යුතු උළු නිෂ්පාදනය සඳහා වන එකතුව රු.1,552,909 ක් වූ ඍජු වියදම් ආයතන හා පරිපාලන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඉ) 2016 වර්ෂයේ මාර්තු සිට දෙසැම්බර් දක්වා වූ මාස 10 කට අදාළව එකතුව රු.566,810 ක් වූ උපචිත කුලිය ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය විසින් වර්ෂය තුළ එක් එක් කම්හල සඳහා අග්‍රිම ගිණුම් 05 ක් පවත්වාගෙන ගොස් තිබුණු අතර, 2016 දෙසැම්බර් 31 දිනට කම්හල් 05 කට අදාළව එකතුව රු.589,746 ක් වූ අග්‍රිම ගිණුම් පියවීමකින් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි.

**2.2.5 පැහැදිලි නොකළ වෙනස්කම්**

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට භෞතික තොග සමීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව එකතුව රු.43,430,594 ක් වූ මුළු තොග ශේෂය ලෙජරයේ තොග ශේෂයට සමාන කිරීම සඳහා අංක 12/58 දරන ජර්නල් සටහන මගින් රු.3,058,645 ක් ලාභ අලාභ ගිණුමට හර කර රු.1,186,269 ක් එම ගිණුමට බැර කර තිබුණි. වර්ෂයේ තොග ඌනතාවය හා අතිරික්තය හඳුනාගැනීමකින් තොරව සිදු කළ මෙම ගිණුම් තැබීම පිළිබඳව විගණනයට ප්‍රමාණවත් පැහැදිලි කිරීම් ඉදිරිපත් නොකරන ලදී.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේ අතැති මුදල් ලෙජර් ගිණුමට අංක 12/108 දරන ජර්නල් සටහන මගින් රු.48,949 ක් බැර කර එම අගය අවිනිශ්චිත ගිණුමට හර කර තිබුණි. මෙම ජර්නල් සටහන ගිණුම්ගත කිරීමේ නිරවද්‍යතාව විගණනයට පැහැදිලි නොකිරීම නිසා, සමාලෝචිත වර්ෂය අවසාන දිනට අතැති මුදල් ගිණුමේ රු.125,000 ක ශේෂයේ නිරවද්‍යතාවය විගණනයට තහවුරු නොවුණි.

(ඇ) මණ්ඩලයේ කම්හල් 05 ක වියදම් දැරීම සඳහා මුදල් ලබාදීමට භාවිතා කරන ලද අග්‍රිම ගිණුම් 06 ක 2016 ජනවාරි 01 දිනට එකතුව රු.2,191,248 ක ආරම්භක ශේෂ වල වෙනසක් පැවතුණි. මෙම වෙනස හඳුනා ගෙන නිවැරදි කිරීමකින් තොරව අංක 12/112 සහ 12/108 දරන ජර්නල් සටහන් දෙක භාවිතා කර එම වටිනාකම අවිනිශ්චිත ගිණුම හර කර අග්‍රිම ගිණුම් බැර කර සමාලෝචිත වර්ෂය තුළ අග්‍රිම ගිණුම් තුලනය කර තිබුණි. මෙම ගිණුම් තුලනය කිරීමේ නිරවද්‍යතාව විගණනයට පැහැදිලි නොකරන ලදී.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ ඔඩ්ඩුසුඩාන්, එරගම කම්හල් කළමනාකරු පාලන ගිණුම්වල පිළිවෙලින් රු.216,049 ක සහ රු.451,000 ක හර ශේෂ සහ ඇලයාපත්තුව කම්හල් කළමනාකරු පාලන ගිණුමේ රු.24,000 ක බැර ශේෂයක් අංක 1/55 ජර්නල් සටහන මගින් අවිනිශ්චිත ගිණුමට මාරු කර පාලන ගිණුම් තුලනය කර තිබුණි. ඒ අනුව කළමනාකරණ පාලන ගිණුම්වල නිරවද්‍යතාව තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම්**

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| (අ) ඉඩම් හා ගොඩනැගිලි | 23,755,784 | මණ්ඩලය සතු උළු කම්හල් 07 කට අදාළව අක්කර 187 රූඩ් 02 ක ඉඩම් සංස්ථාව සතු බවට හිමිකම් ඔප්පු බලපත්‍ර හෝ වෙනත් නීත්‍යානුකූල ලියවිලි |
| (ආ) කම්හල් දෙකක දේපළ පිරියත හා උපකරණ | 3,533,383 | ස්ථාවර වත්කම් වලට අදාළ සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| (ඇ) ගෙවිය යුතු බදු | 176,263,306 | බදු ලිපිගොනු සහ බදු බැරකම තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් ලිඛිත සනාථන හා ගණනය කිරීමේ ලේඛන |
| (ඈ) ලැබිය යුතු ආදායම් බදු | 1,221,666 | |
| (ඉ) වෙනත් තැන්පතු | 3,010,675 | තැන්පතු ලේඛන සහ ශේෂ සනාථන |

**2.3** **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.7,547,407 ක් වූ වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂයෙන් වසර 01 සිට වසර 02 දක්වා වූ ශේෂවල එකතුව රු.2,316,853 ක්ද, වසර 02 සිට වසර 03 දක්වා වූ ශේෂවල එකතුව රු.539,937 ක්ද, වසර 03 ට වැඩි ණය ශේෂවල එකතුව රු.1,289,031 ක්ද විය.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.59,466,030 ක් වූ වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂයෙන් වසර 01 සිට වසර 02 දක්වා ණය ශේෂවල එකතුව රු.485,025 ක්ද, වසර 02 සිට 03 දක්වා එකතුව රු.157,045 ක්ද, වසර 03 ට වැඩි ණය ශේෂවල එකතුව රු.36,556,829 ක්ද විය.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ලෙස දක්වා තිබූ එකතුව රු.1,580,630 ක් වූ විගණන ගාස්තු නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.4** **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්**

විගණනයේදී නිරීක්ෂණය වූ නීති රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම්** |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 135 | මුදල් පාලනය සම්බන්ධ කාර්යයන් ලිඛිතව පවරා දී නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 384 (3) | චෙක් පොත් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 386 (6) | සියලු චෙක්පත් ඇණවුමට ගෙවිය යුතු සේ ලියා රේඛනය කළ යුතු අතර, ගනුදෙනු සඳහා චෙක්පත් විවෘත කිරීමේදී පිටසන් කොට රේඛනය අවලංගු කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ විවෘත චෙක්පත් භාවිතා කර අවස්ථා 13 කදී එකතුව රු.1,825,000 ක ගෙවීම් කර තිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 395 (ඌ) | එකතු වන මුදල් බැංකුවේ තැන්පත් කිරීම, චෙක්පත් ලිවීම, මුදල් පොත පවත්වාගෙන |

| | |
|---|---|
| | යාම යන කාර්යයන්ට සම්බන්ධයක් නැති නිලධාරියෙකු විසින් බැංකු සැසඳුම් පිළියෙල කිරීම සිදු කළ යුතු වුවත්, ඉහත සියළු කාර්යයන් එකම නිලධාරිනියක විසින් සිදු කර තිබුණි. |
| (ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 4.2.6 වගන්තිය | මාස 03 කට වරක් කාර්ය සාධන වාර්තාව සමාලෝචනය කර කාර්තුව අවසන් වී දින 30 ක් ඉකුත් වීමට පෙර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සහ භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය | ලබාගත් අත්තිකාරම් කාර්ය නිම වූ විගස පියවිය යුතු වුවත්, එකතුව රු.326,903 ක් වූ අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසානයට පියවීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 3.2 සහ 3.2.2 වගන්තිය | ඉන්ධන දීමනාව හිමි නිලධාරීන් වෙත අතිරේක ඉන්ධන ලබාදීමේදී රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මාස 06 ක නියැදි පරීක්ෂණ කාලයක් තුළ එසේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව අවස්ථා 15 කදී වටිනාකම රු.166,955 ක අතිරේක ඉන්ධන සඳහා ගෙවීම් කර තිබුණි. |
| (ඉ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | මණ්ඩලය සතු එකතුව රු.38,884,096 ක් වටිනා ඉඩම් ගොඩනැගිලි සහ මෝටර් රථ සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ක්‍රියාකාරකම්

--------------------------------------------------------------------------

වසා දමන ලද උළු කම්හල් යලි විවෘත කිරීම සඳහා මහා භාණ්ඩාගාරයේ සහ රේඛීය අමාත්‍යාංශයේ ලිඛිත අවසරය ලබාගෙන නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

-----------------------

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.12,500,267 ක ශුද්ධ ලාභයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු.3,585,434 ක් වූයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.8,914,833 කින් වර්ධනය වී තිබුණි. 2015 වර්ෂයේදී පුනරාවර්තන වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් ලැබූ රු.63,379,054 ක මුදල 2016 වර්ෂයේදී ලැබී නොතිබුණද සමාලෝචිත වර්ෂයේදී විකුණුම් රු.60,147,061 කින් හා අනෙකුත් ආදායම් රු.3,631,958 කින් වර්ධනය වීම සහ ආයතන හා පරිපාලන වියදම් රු.49,893,646 කින් අඩු වී තිබීම ඉහත වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.
සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2014 වර්ෂයේදී අලාභයක් ලබා තිබූ අතර 2012, 2013, 2015 සහ 2016 වර්ෂ වලදී ශුද්ධ ලාභ ලබා තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික රාජ්‍ය බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැළපීමේදී 2012 වර්ෂයේදී රු.70,430,185 ක් වූ මණ්ඩලයේ දායකත්වය 2013 වර්ෂය අවසානය වන විට රු.35,980,387 දක්වාද, 2014 වර්ෂය අවසානය වන විට රු.10,978,743 ක් දක්වාද අඩුවී තිබුණි. එහෙත් 2015 වර්ෂයේ සිට දායකත්වය නැවතත් වර්ධනය වී තිබූ අතර 2016 වර්ෂය අවසානය වන විට රු.75,889,133 ක් වී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ ජංගම අනුපාතය හා ක්ෂණික අනුපාතය 2015 වර්ෂයේදී පිළිවෙලින් 0.34 ක් හා 0.12 ක් වූ අතර, එය 2016 වර්ෂයේදී පිළිවෙලින් 0.42 ක් හා 0.21 ක් වී තිබුණි. මෙම ද්‍රවශීලතා අනුපාත ඉතා පහළ මට්ටමක පැවතීම හේතුවෙන් ආයතනයේ ද්‍රවශීලතාවය දුර්වල මට්ටමක පැවතුණි.

(ආ) 2015 වර්ෂයේදී සියයට 3.07 ක්ව පැවති මණ්ඩලයේ දළ ලාභ අනුපාතය 2016 වර්ෂය වන විට සියයට 14.65 දක්වා සියයට 377 කින් වර්ධනය වී තිබුණි. 2015 වර්ෂයේදී සියයට 4.15 ක්ව පැවති ශුද්ධ ලාභ අනුපාතය 2016 වර්ෂය වන විට සියයට 8.54 දක්වා සියයට 248 කින් වර්ධනය වී තිබුණි. මෙම වර්ධනය සඳහා විකුණුම් පිරිවැයේ වර්ධනයට වඩා වැඩි වේගයකින් විකුණුම් වටිනාකම වර්ධනය වීම, අනෙකුත් ආදායම් සියයට 145 කින් වර්ධනය වීම සහ ආයතන හා පරිපාලන වියදම් සියයට 77 කින් අඩුවී තිබීම හේතු වී තිබුණි.

# 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්ය සාධනය

1958 අගෝස්තු 01 දිනැති ලංකාණ්ඩුවේ අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව, ශ්‍රී ලංකාව තුළ ප්‍රමිතියකින් යුතු විවිධ වර්ගයේ උළු, ගඩොල් සහ මැටි ආශ්‍රිත නිෂ්පාදනයන්ගේ වෙළඳපොළ ප්‍රමුඛයා වීම සහ තරගකාරී මිල ගණන් යටතේ සියලු පාරිභෝගිකයන් තෘප්තිමත් වන ආකාරයෙන් ද්‍රව්‍ය සැපයීම හා ඒ මත සමාජමය වගකීමක් දැරීම මණ්ඩලයේ ප්‍රධාන අරමුණ විය.

ඉහත සඳහන් අරමුණු ඉටු කර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයට අයත් කර්මාන්තශාලා 09 ම දීර්ඝකාලීනව පෞද්ගලික ආයෝජකයන්ට බදු දීමේ මූලික අරමුණ ඇතිව ආයතනය ප්‍රතිව්‍යුහගතකරණය කිරීමේ අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව, සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය ඉවත්කර 2010 ජූලි 01 දින සිට නිසිබලධාරීවරයෙකු පත්කර තිබුණි. ඒ අනුව, කර්මාන්තශාලා බදු දීමේ ක්‍රියාවලියේ පළමු අදියර වශයෙන් 2012 මාර්තු 31 දින සිට ස්වෙච්ඡා වන්දි ක්‍රමය යටතේ සේවකයින් විශ්‍රාම ගන්වා තිබුණද 2017

දෙසැම්බර් දක්වාම ප්‍රතිව්‍යුහගතකරණ උපදෙස් අනුව කර්මාන්තශාලා කිසිවක් බඳු දීමට කටයුතු කර නොතිබූ අතර, කොන්ත්‍රාත් සහ දෛනික පදනම මත සේවකයින් බඳවාගෙන කර්මාන්තශාලා 05 ක් පවත්වාගෙන ගොස් තිබුණි.

(ආ) මණ්ඩලයට අයත් කර්මාන්තශාලා 09 න් 04 ක් විවිධ හේතූන් මත වසා දමා තිබුණි. 2016 වර්ෂයේදී එරගම හා උස්වැව කර්මාන්තශාලා දෙක පමණක් පිළිවෙලින් රු.34,836,777 ක් සහ රු.5,936,366 ක ලාභ ලබා තිබූ අතර, අනෙක් කර්මාන්ශාලා තුනෙහි මුළු අලාභය රු.14,296,235 ක් විය.

(ඇ) 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේදී බිංගිරිය හා මහියංගනය කම්හල් දෙකෙහි අලාභය පහළ බැස තිබූ අතර, එරගම කම්හලේ ලාභය ඉහළ ගොස් තිබුණි. 2015 වර්ෂයේදී අලාභ ලබා තිබූ උස්වැව කම්හල 2016 වර්ෂයේදී රු.5,936,366 ක ලාභයක් ලබා තිබූ අතර, සමාලෝචිත වර්ෂයේදී යටියන කම්හලේ අලාභය පමණක් රු. 2,599,853 කින් ඉහළ ගොස් තිබුණි.

(ඈ) 2012 වර්ෂයේදී මණ්ඩලයේ නිෂ්පාදනය ඒකක 3,112,050 ක් වූ අතර, ඊට සාපේක්ෂව 2013 හා 2014 වර්ෂ වල නිෂ්පාදනය වාර්ෂිකව පහළ යාමක් නිරීක්ෂණය විය. 2015 වර්ෂයේදී නැවත නිෂ්පාදනය ඒකක 2,609,256 ක් දක්වා වර්ධනය වී තිබූ අතර, 2016 වර්ෂයේදී නිෂ්පාදනය ඒකක 3,950,914 ක් දක්වා වර්ධනය වී තිබුණි. ඒ අනුව, 2016 වර්ෂයේ නිෂ්පාදනය 2014 සහ 2015 වර්ෂ වලට සාපේක්ෂව පිළිවෙලින් සියයට 20.6 ක් සහ සියයට 51.4 කින් වර්ධනය වී තිබුණි.

(ඉ) මණ්ඩලයේ නිෂ්පාදන අලෙවි ආදායම 2012 වර්ෂයේදී රු.112,655,859 ක් වූ අතර, 2013 වර්ෂය වන විට එය රු.77,920,760 ක් දක්වා සියයට 30.8 කින් පහළ බැස තිබුණි. 2014 වර්ෂයේ සිට අලෙවි ආදායම වාර්ෂිකව වර්ධනය වී තිබූ අතර, 2016 වර්ෂයේදී එය රු.156,682,174 ක් වී තිබුණි. ඒ අනුව 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේ අලෙවි ආදායම සියයට 84.6 කින් වර්ධනය වී තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ කාර්ය සාධන වාර්තාව අනුව, ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් එකිනෙක අරමුණු සඳහා ලගා කරගත් ප්‍රගතිය සඳහන් කර නොතිබුණි. ඒ අනුව ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් එක් එක් අරමුණු හා ඉලක්ක ලගා කර ගැනීමේ ප්‍රගතිය පරීක්ෂා කිරීමට නොහැකි විය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත දින 90 කින් අයකර ගැනීමේ පදනම මත 2012 වර්ෂයේදී රු.5,000,000 ක පොළී රහිත තාවකාලික ණය මුදලක් ලබාදී තිබූ අතර, 2016 දෙසැම්බර් 31 දිනටද එම ණය මුදල අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2015 වර්ෂයේදී පත්වීම් ලබාදෙන ලද නිසිබලධාරීවරයා සඳහා වර්තමාන රේඛීය අමාත්‍යවරයාගේ සහ භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

-------------------------------

මණ්ඩලය විසින් 2009 වර්ෂයේ සිට ස්ථාවර වත්කම් ප්‍රතිස්ථාපන සංචිතය ලෙස එකතුව රු.23,372,090 ක් ගිණුම්ගත කර තිබුණද ඊට අදාළ වත්කම් ප්‍රතිස්ථාපනය සඳහා මූල්‍ය ආයෝජනයක් සිදුකර නොතිබුණි.

**4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**-------------------------------------**

සමාලෝචිත වර්ෂය තුළ උස්වැව උළු කම්හල විසින් පෞද්ගලික ආයතනයක සන්නම් නාමය සහිත (DSI) උළු කැට 10,880 ක් 2016 සැප්තැම්බර් සිට ඔක්තෝබර් දක්වා කාලය තුළ නිෂ්පාදනය කර තිබූ අතර, ඒ සඳහා එකතුව රු.214,433 ක් වැය කර තිබුණි. එම නිෂ්පාදිත උළු කැට වලින් උළු කැට 6,492 ක් අලෙවි කළ හැකි තත්ත්වයේ පැවතියද, DSI සන්නම් නාමය හිමි පෞද්ගලික ආයතනයේ අවබෝධතා ගිවිසුමේ ඡේද අංක 10 සිට 13 දක්වා වූ කරුණු වලට අනුව එම උළු මිලදී ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.5 ආර්ථික නොවූ ගනුදෙනු**

**----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතට අනුකූලව නිසි පරිදි පාරිතෝෂික ගෙවීම් ගණනය කර නියමිත කාලය තුළ ගෙවීමට කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය තුළ රු.141,446 ක අධිභාර මුදලක් ගෙවීමට සිදුවී තිබුණි.

(ආ) සේවය අසාධාරණ ලෙස සමාප්ත කිරීමට එරෙහිව සේවකයන් දෙදෙනෙකු විසින් කම්කරු විනිශ්චය සභාවේ ගොණු කළ නඩුවක තීන්දුව ප්‍රකාරව කම්කරු විනිශ්චය සභාව විසින් එම සේවකයින් වෙත ගෙවීමට නියම කළ එකතුව රු.1,081,800 ක වන්දි මුදලක් සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලය විසින් ගෙවා තිබුණි.

**4.6 කාර්ය මණ්ඩල පරිපාලනය**

**----------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.2 ඡේදය අනුව අනුමත සේවක සංඛ්‍යාව සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වුවත්, 2012 වර්ෂයේ මණ්ඩලය ප්‍රතිව්‍යුහගතකරණය යටතේ සේවකයන් වන්දි ගෙවීම් කර ඉවත් කිරීමෙන් පසු මණ්ඩලයේ ඉදිරි කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය සේවක සංඛ්‍යාව අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) උක්ත චක්‍රලේඛයේ 9.10 වගන්තිය අනුව පුරප්පාඩු තනතුරු සඳහා කොන්ත්‍රාත්, අනියම් හෝ වෙනත් පදනමක් මත සේවකයින් බඳවා ගැනීමේදී භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතු වුවත්, එසේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව කොන්ත්‍රාත් පදනමට නිලධාරීන් 61 දෙනෙකු බඳවාගෙන තිබුණි.

(ඇ) රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ අමාත්‍ය කාර්ය මණ්ඩලයේ පූර්ණ කාලීනව සේවය සඳහා බඳවාගත් සේවකයෙකු වෙත සංස්ථාව විසින් 2016 වර්ෂයේදී එකතුව රු.50,000 ක්ද 2017 වර්ෂය තුළ රු.280,000 ක් ද ලෙස එකතුව රු.330,000 ක් ගෙවා තිබුණි.

(ඈ) බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියක් අනුමත කර ගැනීමකින් තොරව හා විධිමත් බඳවා ගැනීමේ ක්‍රමවේදයක් අනුගමනය කිරීමකින් තොරව මූල්‍ය කළමණාකාරිනියක් 2015 නොවැම්බර් මාසයේදී බඳවාගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.675,000 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. එම නිලධාරිනියගේ සේවය 2017 ජනවාරි අවසන් කර තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

---------------------------------------------

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකිරීම**

-----------------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව, මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, මණ්ඩලයේ 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 දෙසැම්බර් 22 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

**5.2 සංයුක්ත සැලැස්ම**

--------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 වගන්තිය ප්‍රකාරව මණ්ඩලය විසින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5.3 ක්‍රියාකාරී සැලැස්ම**

--------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 වගන්තියට අනුව ක්‍රියාකාරී සැලැස්මේ දැක්වෙන අරමුණු හා ඉලක්ක පිළිබඳව ආයතනයේ කළමනාකරුවන් සතු වගකීම පැහැදිලිව දැක්විය යුතු වුවත්, මණ්ඩලය විසින් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.

(ආ) 2014 පෙබරවාරි 14 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5(2) වගන්තිය අනුව ආයතනය විසින් පිළියෙල කරන ව්‍යාපාරික සැලැස්ම පදනම් කරගෙන ඉදිරි මුදල් වර්ෂයේදී ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත වාණිජ ක්‍රියාකාරකම් ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර නොතිබුණි.

**5.4 විගණන කමිටු**

-----------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය අනුව අවම වශයෙන් මාස තුනකට වරක් විගණන කමිටු පැවැත්විය යුතු වුවත්, මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය තුළ විගණන කමිටු රැස්වීම් එකක් පමණක් පවත්වා තිබුණි.

**5.5 ප්‍රසම්පාදන සැලැස්ම**

--------------------------

2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය ප්‍රකාරව, මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

**5.6 අයවැය ලේඛනමය පාලනය**

---------------------------------

1971 අංක 38 දරන මුදල් පනතේ 8 (1) වගන්තිය සහ 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2 වගන්තිය ප්‍රකාරව මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

## 5.7 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය අනුව මුදල් වර්ෂයක් අවසන් වී දින 150 ක් ඇතුළත වාර්ෂික වාර්තා භාෂාත්‍රයෙන් පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ වාර්ෂික වාර්තා 2017 දෙසැම්බර් දක්වා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ නිසිබලධාරීවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) මූල්‍ය පාලනය | (i) ලෙජරය ඇතුළු ගිණුම් පොත්පත් යාවත්කාලීනව පවත්වා නොගැනීම.<br>(ii) ගිණුම් අංශ කටයුතු සඳහා ස්ථිර කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකු සේවයේ නොයෙදීම.<br>(iii) අත්තිකාරම් ගිණුම් තැබීම පිළිබඳ වූ ක්‍රියාවලිය නිසි පරිදි පවත්වා නොගැනීම, අත්තිකාරම් ලේඛනයක් පවත්වාගෙන නොයාම<br>(iv) ආයතනය තුළ ක්‍රමවත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොකිරීම. |
| (ආ) ගබඩා පාලනය | (i) ජංගම නොවන වත්කම් භෞතික සත්‍යාපනය සිදු නොකිරීම.<br>(ii) භෞතික තොග ගණනය කෙටි කාලයක් තුල අවසන් නොකිරීම |
| (ඇ) මෙහෙයුම් පාලනය | කම්හල් බදු දීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක නොකිරීම. |